# සතියේ සිතිවිල්ල

"සතියෙ සිතිවිල්ල" දීර්ඝ කාලයක් තිස්සේ ඉරිදා ලංකාදීප පුවත්පතේ පළ වූ තීරු ලිපි පෙළකි. මෙම ලිපි සතිපතා කියවන අතර තුර එහි ගැබ් වන අදහස් කෘතියක් වශයෙන් පළවීම වැදගත් මෙන්ම ඒ තුළින් දේශපාලනඥයෙහි නිරත තීරණාත්මක චරිතයක් දක්වන අදහස් සංවාදයට ලක් කිරීමට අවස්ථාව උදාවීමක් විය. ආර්ථික සමාජීය කරුණු අලලා ලියැවුණු ලිපි 40ක් සතියේ සිතුවිල්ල කෘතියට ඇතුළත්ය. සාමාන්‍ය ජනතාවට කියවා තේරුම් ගැනීමට පහසු භාෂාවකින් නිරවුල්ව ලියැවී තිබීම විශේෂයෙන් ආරම්භයේදීම සඳහන් කළ යුතුය.

ලිපි කියවා අවසන් වන විට දැනෙන්නේ සංවර්ධනය සඳහා භාවිතා කළ යුතු පුළුල් දර්ශනයක් මෙම ලිපි පෙළ හරහා සියුමව විද්‍යමාන වන බවයි. එමෙන්ම නොයෙක් අවස්ථාවල ජාත්‍යන්තර අත්දැකීම්, දියුණු රටවල අත්හදා බැලීම්, සාකච්ඡා කර තිබේ. එහෙත් නැවත නැවතත් ලිපි වලින් සංවේදීව කරුණු දක්වන්නේ ශ්‍රී ලංකාවේ ඉතිහාසය පිළිබඳවය. රටට සමාජයට අතීතයේදී සියලු දේ සඳහා ශක්තියක් තිබූ බවය.

බුද්ධාගමෙන් ලැබූ ආභාසය, සංස්කෘතිකමය ලකුණු, ඉතිහාසයේ සම්පත්කම් හා සමාජයේ අරමුණු සමග බිහිවූ සීගිරිය, රුවන්වැලිසෑය ගැන මිලින්ද මොරගොඩ උදාහරණ ලෙස දක්වයි. එමෙන්ම වාරිකර්මාන්තය ඒ සඳහා තිබුණු ඉංජිනේරු ශක්තිය ගැන ද සඳහන් කරයි. සාමාන්‍යයෙන් අද සමාජ නායකයන් එදාමෙදා සම්බන්ධ කරන අතර තුර විශේෂයෙන් බොහෝ විට හුවා දක්වන්නේ අද පරපුරට නගන දෝෂාරෝපණයයි. නමුත් මිලින්ද සිය ලිපි කිහිපයකම දක්වන්නේ හැකියාවෙන් යුත් අපේක්ෂා සහගතව බැලිය යුතු බුද්ධිමත් මානව සම්පතක් රටට සිටින බවයි. ඒ සඳහා ඔහු පෙන්වා දෙන්නේ පිටරට වල ඕනෑම ක්ෂේත්‍රයක කැපවීමෙන් සේවය කරන පිරිසය. තාක්ෂණික වෛද්‍ය පරිපාලන, වෙළඳ අංශවල කීර්තිමත් ශ්‍රී ලාංකිකයන් විවිධ ජාත්‍යන්තර සමාගම් වල මුල් පුටු වල සිටින බවය. පිටරටකදී ඕනෑම දෙයක් කරන මෙරට ජනතාව මෙහිමෙදී ගොලු වන්නේ නිහඬ වන්නේ මන්ද? ආත්ම ශක්තිය හීන වන්නේ ඇයිද යන ප්‍රශ්නය මිලින්ද පෙරළා සමාජයෙන් ප්‍රශ්න කරයි. නමුත් එතැනින් නතර නොවන හෙතෙම අවස්ථාවක එම ප්‍රශ්නයට පිළිතුරු දෙන්නේ තමන්ද දේශපාලනඥයෙකුද බව අවතක කරමිනි. මේ මානව සම්පත නිසි ලෙස හසුරුවන්නේ නැති වීමටත් රටේ සියලු දෙනා බෙදී වෙන්වීමටත් සහ හැකියාවන් ඇති පිරිසට අවස්ථාව නොලැබීමටත් එකම හේතුව දේශපාලනය බව ඔහු සෘජුව කියා සිටියි.

නිදහසින් පසු ගතවූ කාලය තුළ මෙරට ඇති වූ දේශපාලනය විසින් රටේ සංවර්ධනය හෝ මහජනතාවගේ අපේක්ෂා ගැන නොතකා බලය ගැන පමණක් සිතා කටයුතු කිරීමේ ඵලවිපාක ගැන මිලින්ද සිය කෘතියෙන පැහැදිලිව දක්වයි. ඉන්දියාව,ඔහු එයට හොඳ පාඩමක් ලෙස පෙන්වයි. භාෂා, ආගම්, දේශපාලන වශයෙන් නොයෙක් බෙදීම් ඇතත් රට වෙනුවෙන් එකට කටයුතු කරන ඉන්දියානුවන් ගැනත්, කොතරම් ගෝලීයකරණයේ බලපෑම් වලට ලක්වුවත් ඉන්දියානු දර්ශනය පෙරට ගන්නට ඉන්දියානු නායකයන් සමත්වීම ගැනත් දක්වන්නේ ශ්‍රී ලංකාව අනන්‍යතාව සම්බන්ධයෙන් අතරමංව ඇති බව සඳහන් කරමින්ය.

මලයාසියාව, සිංගප්පූරුව, ජපානය, බ්‍රිතාන්‍යය, ඇමරිකාව වැනි රටවල දර්ශනය සමාජ තත්ත්වය සහ අනාගත ඉලක්ක පිළිබඳව මෙම ලිපි පෙළ අතර වැඩි වශයෙන් සාකච්ඡා කර ඇත්තේ ඒ අතරින් ආසියාවේ නායකත්වයන්හි ගැබ්වී ඇති දර්ශනය වෙනමම ගැඹුරින් දක්වමින්ය. ඒ අතර ශ්‍රී ලාංකිකයන්ගේ ශක්තිය එකතු කර අනන්‍යතාව ගොඩනැගීමේ වැදගත්කම පෙන්වා දෙන්නේ ගතවූ වසර පනහකට වැඩි කාලයක් තිස්සේ සිදු වූ වැරදි අනාගත පරපුරට උරුම නොකළ යුතු බවට තීන්දු කරමින්ය.

අතීත, උරුමය ජාත්‍යන්තර අත්දැකීම් සහ විශේෂයක් ආගමික පසුබිම මුහුකර ජාති, ආගම්, කුල පක්ෂ ගුරුකුල වශයෙන් බෙදීම නතරකර සියලු දෙනා එකතු කර නව දර්ශනයක් ඇති කිරීම සඳහා අද ඇති අවස්ථා වැදගත් බවද මිලින්ද මොරගොඩ සිය ලිපිවලින් පෙන්වා දෙයි. ඉංග්‍රීසි භාෂාව හා තාක්ෂණය සමාජයේ බෙදීම් නතර කර එකතු කරන්නට වහල් කර ගත යුතු මිස ඒවා සමාජයේ බැබලෙන්නට ඇති විය යුතු තත්ත්වයන් නොවන බව ඔහු වෙහෙසින් හුවා දක්වයි.

දේශපාලනඥයන්ට මේ සඳහා ඇති යුතුකම හා වගකීම එකතු වී කටයුතු කිරීම බව ඔහු පෙන්වා දෙන්නේ සමාජයේදී හා පාර්ලිමේන්තුවේදී දේශපාලනඥයන් බලය සඳහා කටයුතු කිරීම නවතා රට ගැන වගකීමක් ඇතිව සමගියෙන් කටයුතු කිරීමේ වැදගත්කම දක්වමින්ය. ඒ සඳහා ආණ්ඩුවේ හා විපක්ෂයේ තිබිය යුතු යුතුකම් හා වගකීම් සම්බන්ධව පුන පුනා සාකච්ඡා කරයි. ඒ හැම අවස්ථාවකම කතා කරන්නේ ඕනෑම විපක්ෂයක වගකීම හැම දෙයකටම විරුද්ධ වීම නොවන බව හෙළි කරමින්ය. අතීතය සමග සසඳන විට ආණ්ඩුවක හා විපක්ෂයක ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණය විය යුත්තේ මහජන යහපත බව මිලින්ද මොරගොඩ ගේ සිතිවිලි වලින් හෙළිවීම වැදගත්ය.

වැඩ වර්ජන, පෞද්ගලීකරණය, කම්කරු නීති රීති, තාක්ෂණය උපයෝගී කර ගැනීම, රාජ්‍ය පාලනයේ ඇති කළ යුතු ප්‍රතිසංස්කරණ පෞද්ගලික අංශයට සහන දිය යුතු වීම වැනි කාරණා ගැන මිලින්ද මොරගොඩ, සෘජුව අදහස් දක්වයි. එතැනදී තමන් ආණ්ඩුවේ හෝ විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් නොව සමාජ අවශ්‍යතා දකින විද්වතෙක් ලෙස කටයුතු කිරීමට නිර්භය වෙයි. ඔහු රාජ්‍ය ආයතන හා පෞද්ගලීකරණය දෙස බලන්නේ න්‍යායාත්මක නොව ආර්ථික වශයෙන් රටට සහ සමාජයට අත්පත් විය හැකි හොඳ නරක තක්සේරු කිරීමේ දෘෂ්ටි කෝණයකිනි. දේශපාලන කාරණා නිසා පිරිහෙන ආයතන බර අවසානයේ දරන්නේ සාමාන්‍ය මහජනතාව බවත් රාජ්‍ය ආයතන පෞද්ගලීකරණය කිරීම හැර විකල්පයක් නැති තැනක එය අවශ්‍ය වන බවත් ඔහු පෙන්වා දෙන්නේ ඉන්දියාවේ හෝ සිංගප්පූරුවෙ රාජ්‍ය ආයතන දේශපාලනයෙන් තොරව ජාත්‍යන්තර වෙළඳපොළ ජය ගෙන ඇති බව දක්වමින්ය. එමෙන්ම මුහුද, භූමිය, ඇතුළු මෙරට ස්වාභාවික සම්පත් නිසි ලෙස ප්‍රයෝජනයට ගෙනනැති අන්දම හා රැකියා වෙළඳපොළ සම්බන්ධව දක්වන නිර්වචනය මෙරට ප්‍රතිපත්ති සම්පාදකයන්ට පාඩම් පොතක් විය හැකි විශ්වාසයයි.

පැරණි පත් පැදුරෙන් තාක්ෂණයට නොඑසේ නම් පරිගණකයේ යතුරු පුවරුවට එසැවෙන සමාජයක් ගැන ඉඟිකෙරෙන සංකල්පනාත්මක කවරයකින් යුත් සතියේ සිතිවිල්ල මෑත කාලය තුළ තමන්ට දැනෙන හැඟෙන කාරණා මැදහත්ව සමාජයට ලියා තැබූ කැඩපතකි. ගැඹුරින් කල්පනාකර පළකර ඇති මෙම වැදගත් අදහස් කීපය දෙස බුද්ධිමත්ව, විවේචනාත්මකව හා සාවධානව සමාජය දෙස බැලීම මිලින්ද මොරගොඩ මහතා අපේක්ෂා කරයි.

විමර්ශන




විශ්‍රාමලත් අමාත්‍යාංශ ලේකම්
එම්.ඩී. ඩී. පීරිස්